**උකුවෙල ප්‍රාදේශීය සභාව - 2023**
**---------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

උකුවෙල ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම, ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශන වලට අදාල සටහන් වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට උකුවෙල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උපවගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තව දුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාල සීමාවන් තුළ සහ අදාළ නීතී,රීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දී රු.629,200 ක් වැයකර ලබා ගන්නා ලද දෙපැති පොත් රාක්ක 14 ක් රු. 484,000 ක් ලෙස රු.145,200 ක් අඩුවෙන් ගිණුම් ගතකර තිබුණි. | 2024 වර්ෂයේ ගිණුම මගින් නිවැරදි කිරීමට කටයුතු කරන බව. | ගිණුම් නිවැරදිව පිළියෙල කළයුතුයි. |
| (ආ) | සමාලෝචිත වර්ෂයට අදාල ජල හා විදුලිය වෙනුවෙන් 2024 වර්ෂයේදී ගෙවන ලද රු.132,503 ක මුදල සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස ගිණුමගත කර නොතිබුණි . | -එම- | -එම- |
| (ඇ) | ගබඩා තොග පොත්වල සඳහන් ලිපිද්‍රව්‍ය එකතුව රු.368,240 ක ඒකක 7015 ක් මූල්‍ය ප්‍රකාශනවලට ගෙන නොතිබුණි . | -එම- | -එම- |

### 1.6.2 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසන් දිනට මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු ගිණුම් විෂයයන් 03 ක එකතුව රු.14,267,873 ක ශේෂයන්ට අදාල ස්ථාවර වත්කම් ලේඛන හා ලිපිගොනු ඉදිරිපත් නොකිරීම හේතුවෙන් විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය | තොරතුරු හඳුනාගෙන 2024 වර්ෂයේ යාවත්කාලීන කිරීමට කටයුතු කරන බව. | එක් එක් ශේෂයන් තහවුරු කිරීම සඳහා ලේඛන හා ලිපිගොනු පවත්වා ගත යුතුය. |

### 1.7 අනුකූල නොවීම

**නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම්**

නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | අනුකූල නොවීම් | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(අ) පාර්ලිමේන්තු පනත්** | | | |
| (i) 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ ත්‍රීරෝද රථ නවතා තැබීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාවේ 4(1) වගන්තිය | සභා බල ප්‍රදේශය තුල ත්‍රීරෝද රථ නවතා තැබිය යුතු ස්ථාන සහ එක් එක් ස්ථානයේ නවතා තැබියයුතු උපරිම ත්‍රීරෝද රථ සංඛ්‍යාව තීරණය කර ගැසට් පත්‍රයක් මඟින් ප්‍රකාශයට පත්කළයුතු වුවත් එසේ සිදුකර නොතිබුණි. | මාර්ග සංවර්ධන අධිකාරියේ හා පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ නිර්දේශ නොමැති බැවින් ඉදිරි කටයුතු කිරීම අපහසු වී ඇති බව. | පනතේ විධිවිධාන අනුගමනය කළයුතුය. |
| **(ii) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත** | | | |
| 24 වගන්තිය | 1963 වර්ෂයේ ගම් සහා පාරවල් ලෙස 696 ක් ගැසට් පත්‍රයේ සඳහන්ව තිබුණද ඉන් පසු සභාවට අයත් පාරවල් වෙනස් වීම් සම්බන්ධයෙන් නැවත ගැසට් කර ප්‍රකාශයට පත්කිරීමට කටයුතු කර නොතිබුණි | මාර්ග මැනුම් කර පිඹුරුපත් සකසා ගැසට් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරන බව. | පනතේ විධිවිධාන අනුගමනය කළයුතුය. |

**(ආ) 1988 ප්‍රාදේශීය සභා මූල්‍ය හා පරිපාලන (රීති)**

| | | | |
|---|---|---|---|
| රීති 61 | වෙළඳ කර්මාන්ත හා ව්‍යාපාර බලපත්‍ර සම්බන්ධව සමීක්ෂණයක් සිදුකර එම සමීක්ෂණ වාර්තාවේ තොරතුරු අනුව පී.එස්. 26 ඒ ආකෘතියේ ලේඛනයේ සටහන් නොකර බලපත්‍ර ගාස්තු ගෙවන අවස්ථාවේ ලේඛණගත කරන අවිධිමත් ක්‍රමවේදයක් අනුගමනය කර තිබුණි . | P.S 2 6 ආකෘතියට අනුව ඉදිරියේදී ලේඛනගත කිරීමට කටයුතු කරන බව. | රීති ප්‍රකාරව කටයුතු කල යුතුය. |

**(ඇ) චක්‍රලේඛ**

| | | | |
|---|---|---|---|
| 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 වගන්තිය | සභාව සතු ධාවන තත්ත්වයේ පවතින වාහන 10ක් සම්බන්ධව වසර 1 ත් 12 ත් අතර කාලයක සිට ඉන්ධන දහන පරීක්ෂාව සිදු කර නොතිබුණි. | ඉදිරියේදි ඉන්ධන පරික්ෂාවන් සිදු කරන බව. | චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළ යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.14,736,339 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 32,311,455 ක් විය.

**2.2 ආදායම් පරිපාලනය**

**2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්**

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ලේකම් විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2023 | | | | 2022 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 901,000 | 929,923 | 1,124,437 | 255,196 | 2,101,000 | 2,111,813 | 2,425,177 | 449,710 |
| (ii) | කඩ කුලී | 1,300,000 | 2,184,295 | 2,594,072 | 36,940 | 4,000,000 | 1,239,710 | 1,416,971 | 446,717 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 120,000 | 163,950 | 163,950 | - | 1,110,000 | 546,330 | 546,330 | - |
| (iv) | වෙනත් ආදායම් ජල | 4,500,000 | 6,394,048 | 5,393,065 | 2,580,547 | 5,000,000 | 3,749,009 | 4,437,448 | 1,579,564 |
| | එකතුව | 6,821,000 | 9,672,216 | 9,275,524 | 2,872,683 | 12,211,000 | 7,646,862 | 8,825,926 | 2,475,991 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(අ)** | **වරිපනම් හා බදු** | | |
| (i) | වරිපනම් හිඟය රු.1,000 ට වැඩි දේපල 69 න් ලැබියයුතු රු.202,636 ක හිඟ හිටි වරිපනම් ගාස්තු ආදායමක් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158 ප්‍රකාරව අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ මුදලද මැයි,ජූනි මාස තුලදී ජංගම සේවා වැඩසටහන් පවත්වා අය කර ගැනීමට කටයුතු කරන බව. | හිග ආදායම් අයකර ගැනීමට කටයුතු කල යුතුය. |
| (ii) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පෞද්ගලික හා රාජ්‍ය ආයතනවල වරිපනම් ඒකක 25 කින් වර්ෂ 2 ත් වර්ෂ 15 ත් අතර කාලයක සිට හිඟ වරිපනම් ගාස්තු රු.119,414 ක් අයකර නොතිබුණි. | රජයේ දේපලවල හිඟ වරිපනම් බදු මුදල අයකර ගැනීම සඳහා නීතිමය ක්‍රියාමාර්ග ගැනීමේ හැකියාවක් නොමැති බව. | හිග ආදායම් අයකර ගැනීමට කටයුතු කල යුතුය. |
| **(ආ)** | **කඩ කුලී** | | |
| | 2021 දෙසැම්බර් 15 හා 2022 නොවැම්බර් 16 දින තක්සේරු දෙපාර්තමේන්තුවේ තක්සේරු වාර්තාව අනුව කඩකුලී අය නොකිරීම නිසා සමාලෝචිත වර්ෂයේ ජනවාරි සිට දෙසැම්බර් දක්වා කාලය තුල කඩ කාමර 16 කින් රු. 751,500 ක කඩ කුලී ආදායමක් අයකර නොතිබුණි. | පාලනය කර ගැනිමට නොහැකි කරුණු මත පමාවක් සිදු වුව ද සභාවට පාඩුවක් වන සේ හිතාමතා කටයුතු කර නොමැති බව. | තක්සේරු දෙපාර්තමේන්තුවේ තක්සේරු කුලිය ප්‍රකාරව කඩකුලී අයකිරිමට කටයුතු කල යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දේපල ණය පොළී ප්‍රතිපූර්ණය ලෙස සභාවට ලැබියයුතු රු.560,776 ත් සමඟ සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට ලැබිය යුතු ගිණුම් ශේෂ 4 ක එකතුව රු.3,819,059 ක් අයකරගෙන නොතිබුණු අතර , ඉන් අය නොකර පවතින කාලය වසර 1 ට වැඩි හා 5 ට අඩු ශේෂය රු.635,734 ක් ද, වසර 5 ට වැඩි ශේෂය රු.663,840 ක් ද විය. | දේපල ණය සඳහා රජය විසින් දරන ලද පොළී මුදලින් අප වෙත ප්‍රතිපූර්ණය විය යුතු මුදල් වල එකතුවක් වන බවත් හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කරන බවත්. | හිග ආදායම් අයකර ගැනීමට කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට ගෙවිය යුතු සංවර්ධන ව්‍යාපෘති 34 ක එකතුව රු.12,853,802 ක් නිරවුල් කර නොතිබුණු අතර, ඉන් නිරවුල් නොකර පවතින කාලය වසර 1 ට වැඩි හා වසර 5 ට අඩු ශේෂය රු.7,685,168 ක් ද, වසර 5 ට වැඩි ශේෂය රු. 332,813 ක් ද විය. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීමට කටයුතු කල යුතුය. |
| (ඇ) | ලී මෝල් , වඩු මඩු හා ඇඹරුම්හල් 05 කට පරිසර ආරක්ෂණ බලපත්‍ර නිකුත් කර නොතිබුණු අතර, මේ හේතුවෙන් එකතුව රු.59,700 ක ආදායමක් අහිමි වී තිබුණි . | මේ වන විට ව්‍යාපාර 5 ක් සඳහා වෙළඳ බලපත්‍ර ලබා දී ඇත.එක් ව්‍යාපාරයක් වසා ඇති බව. | නිසි අධීක්ෂණයක් යටතේ බලපත්‍ර නිකුත් කර ගාස්තු අයකිරීමට කටයුතු කල යුතුය. |

## 3.2 වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාව පරිහරණය කරන වට්නාකම තක්සේරු කර නොතිබුණු ඉඩම් 67 ක් සහ රු.13,756,000 ක ඉඩම් 11 ක අයිතිය පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඉඩම් වල අයිතිය පවරා ගැනීමට කටයුතු කරන බව . | ඉඩම්වල අයිතිය පවරා ගැනීමට කටයුතු කළයුතුය. |

## 3.3 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| උකුවෙල ප්‍රාදේශීය සභාවේ අනුමත කාර්ය මණ්ඩලය සහ තථ්‍ය කාර්ය මණ්ඩල පිළිබඳ පරීක්ෂාවේදී සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට තනතුරු 10 ක පුරප්පාඩු 13 ක් සහ තනතුරු 02 ක අතිරික්ත 11 ක් පැවතුණි. | මෙම තනතුරු සම්බන්ධයෙන්ද මාසික කාර්ය මණ්ඩල වාර්තා මගින් අදාල ආයතන දැනුවත් කර ඇති බව. | අනුමත කාර්යය මණ්ඩලය පවත්වාගෙන යාමට කටයුතු කළයුතුයි. |